# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

4 වසර /Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**ඉතිහාසය**
**History**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලටමත්, II වන කොටසින් ප්‍රශ්න 04කටත් පිළිතුරු සපයන්න.**

### I. කොටස

01 **කෙටි පිළිතුරු සපයන්න.**

i අනුරාධපුරයෙහි පළමුවරට **මධ්‍ය පාලනයක්** ආරම්භ කළ රජතුමා කවුද?

ii බුදු සමය පැමිණීමට පෙර **චීනයේ පැවති ආගම් දෙකක්** නම් කරන්න.

iii පොළොන්නරු යුගයෙන් පසු මෙරට **බිහි වූ රාජධානි** දෙකක් නම් කරන්න.

iv "අමිත්‍රඝාතක" නමින් හැඳින්වූ **මෞර්‍ය අධිරාජයා හා ඔහුගේ පුරෝහිතයා** කවුද?

v පළමුවන විමලධර්මසූරිය රජු දවස ලක්දිවට පැමිණි **ලන්දේසි අද්මිරාල්වරයා** කවුද?

vi ක්‍රි.ව. 1602 දී බලන සටන මෙහෙය වූ පෘතුගීසි කපිතාන්වරයාගේ නම ලියා දක්වන්න.

vii නූතන ප්‍රජාතාන්ත්‍රවාදයේ ආරම්භය ලෙස සැළකෙන **ග්‍රීක පෞර රාජ්‍යයන් දෙකක්** නම් කරන්න.

viii **ක්‍රි.ව. 1521** දී කෝට්ටේ රාජ්‍යයෙහි ඇති වූ **ඓතිහාසික** සිදුවීම කුමක් ද? එයට මුහුණ දුන් **රජතුමා** කවුද?

ix ථේරවාදී බුදු දහම හා මහායාන බුදු දහම **පැතිරගිය අග්නිදිග** ආසියාතික රටවල් දෙක බැගින් නම් කරන්න.

x මහනුවර යුගයේ මෙරට **උපසම්පදාව** පිහිටුවීමට මුල් වූ **ලාංකීය හා සියම් භික්ෂූන්** වහන්සේලා නම් කරන්න.

(ලකුණු 4 x 10 = 40යි)

### II. කොටස

02 i බුරුමයේ විසූ පැරණි ජනවර්ග දෙක නම් කරන්න.

ii බුරුමය හා ලංකාව අතර පැවති ආගමික හා දේශපාලනික සබඳතා විස්තර කරන්න.

iii බුරුමයේ බුදු සසුන ව්‍යාප්තියට හා වර්ධනයට අනුරුද්ධ රජුගෙන් ඉටු වූ සේවය පැහැදිලි කරන්න.

(ලකුණු 04 + 05 + 06 = 15යි)

03 i ග්‍රීක ශිෂ්ටාචාරයේ දීප්තියට හේතු වූ **පඬිවරුන් 04ක්** නම් කරන්න.

ii රෝම ශිෂ්ටාචාරයේ **ආරම්භය හා එහි වර්ධනය** සිදු වූ අයුරු විමසන්න.

iii මගධ අධිරාජ්‍යයේ **ව්‍යාප්තිය හා එහි උන්නතියට** ධර්මාශෝක රජුගෙන් ඉටු වූ මෙහෙය කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04 + 05 + 06 = 15යි)

04 i පොළොන්නරු යුගයේ දී **තුන් නිකාය සමගි කිරීමට** මුල් වූ තෙරුන් වහන්සේ හා රජු නම් කරන්න.

ii රාජධානි නිරිතදිගට **මාරුවීමට** බල පෑ හේතු දෙකක් විස්තර කරන්න.

iii හයවන පැරකුම්බා රජ සමයේ ලංකාවේ **ඉතිහාසය දීප්තිමත්** යුගයකි. එයට පැරකුම් රජුගෙන් ලැබුණු **දායකත්වය** පැහැදිලි කරමින් කරුණු විමසන්න. (ලකුණු 04 + 05 + 06 = 15යි)

05 i යුරෝපීය ජාතීන් පෙරදිගට පැමිණීමේ **ප්‍රධාන අරමුණු** දෙක කුමක් ද?

ii පෘතුගීසීන් හා කෝට්ටේ රාජධානිය අතර පැවති **සබඳතාව** කෙසේ වී දැයි විස්තර කරන්න.

iii පෘතුගීසීන්ගේ ආගමනය නිසා මෙරට ඇති වූ **ආගමික හා** ආර්ථික විපර්යාසය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04 + 05 + 06 = 15යි)

06 i 1638 දී ඇතිකරගත් සිංහල ලන්දේසි ගිවිසුමේ **වගන්ති** දෙකක් නම් කරන්න.

ii රෝම **ලන්දේසි නීතිය** පිළිබඳ විමසීමක් කරන්න.

iii කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා සරණංකර සංඝරාජ මාහිමියන් **එකතුවීම** නිසා මෙරට ඇති වූ **ශාසනික ප්‍රබෝධය** විස්තර කරන්න (ලකුණු 04 + 05 + 06 = 15යි)

07 පහත සඳහන් මාතෘකා අතරින් **03ක්** පිළිබඳ **විස්තර** කරන්න.

i සීතාවක රාජධානිය

ii සියම් ලංකා සබඳතා

iii ලක්දිව වාරි සංස්කෘතිය

iv ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගම

v පළමුවන පැරකුම්බා රජතුමා

iv කෝට්ටේ යුගයේ සාහිත්‍ය ප්‍රබෝධය

(ලකුණු 05 x 03 = 15යි)

The National e-Learning Portal for The General Education